# රාජ්‍ය නොවන සංවිධාන කොටි සංවර්ධනය කිරීම

මේ ලිපිය ලියන මොහොත වන විට කිලිනොච්චියෙහි හා ඒ අවට ප්‍රදේශයෙහි හැරුණු විට අනෙක් ප්‍රදේශවල ලංකාණ්ඩුවේ හමුදා බලය තහවුරු කරගෙන ඇත. හමුදා කිලිනොච්චියෙහි ද බලය තහවුරු කරන දිනය වැඩි ඈතක නො වේ. එබැවින් මෙතෙක් දශක දෙකක් පමණ කාලයක් මුළුල්ලේ දැකහත නොහැකි වූ උතුරේ බොහෝ ප්‍රදේශ දැන් හමුදාවන්ට මෙන් ම අවශ්‍ය නම් ජනමාධ්‍යවලට ද දැකගත හැකි ය. මෙහි දී පැන නගින ප්‍රශ්න කිහිපයක් සඳහන් කිරීමත් ඒ සම්බන්ධයෙන් ආණ්ඩුව ඉදිරියේ දී ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡාවක් ඇතිකිරීමත් මේ ලිපියෙහි අරමුණු අතර වෙයි.

දැනට ඇතැම් තැනක ගුවන් ධාවන පථ දැකගන්නට ඇතැයි වාර්තා වෙයි. එහෙත් තවමත් ගුවන් යානයක් දැකගත නොහැකි වී ඇත. සමහරවිට ගුවන්යානා කැලයේ සඟවා ඇතැයි සිතිය හැකි ය. එහෙත් එවැනි හෝඩුවාවක්වත් නැත. ගුවන්යානයක් දැකගත නොහැකි නම් කටුනායකට හා වෙනත් තැන්වලට පැමිණියේ යැයි කියන ගුවන් යානාවලට සිදුවූයේ කුමක් ද? අනෙක් අතට ගුවන් ධාවන පථ යැයි හැඳින්වෙන තීරු කවරේ ද? එවා යොදාගනු ලැබුයේ ගුවන් යානා ගුවන්ගත කිරීමට හා බැස්සවීමට ද? එසේත් නැත්නම් වෙනත් කාර්යයකට ද?

පසුගිය දා කැලණිතිස්ස විදුලිබලාගාරයට බෝම්බ දැමීමට පැමිණි ගුවන් යානය අද ඇත්තේ කොහේ ද? එය වෙඩි තබා විනාශ නොකළ බැවින් ඒ තවමත් යම්කිසි ප්‍රදේශයක තිබිය යුතු ය. ප්‍රශ්නය වනුයේ ගුවන්යානය ලංකාවේ නැත්ද යන්න ය. එසේ නොමැති නම් ඒ පැමිණියේ කොහෙන් ද? ඒ ගියේ කොහාට ද? ඒ ගුවන් යානා පැදවූයේ කවු ද? යම් හෙයකින් ඔවුන් විජාතිකයන් නම් ප්‍රශ්නය තවත් උග්‍ර වෙයි. අපි මේ ප්‍රශ්න පිළිබඳ ව පැහැදිලි පිළිතුරු බලාපොරොත්තු වෙමු.

කොටි සංවිධානය පරාජය කළහැකි බව අප පැවසුවේ අද ඊයේ නොවන බව අද යුද වීරයන් බවට පත් වී සිටින දේශප්‍රේමීන්ට හා ජාති හිතෙෂීන්ට පුන පුනා මතක් කර දිය යුත්තේ ඔවුන් බොහෝ දෙනකු එදා ඊනියා යුද්ධයට විරුද්ධ වූ නිසා නොව ඔවුන්ට ඒ බව අමතක වී ඇති බැවින් ය. කෙසේ හෝ අපේ ප්‍රශ්නය ඊනියා යුද වීරයන් නො වේ. අපට අවශ්‍ය වන්නේ කොටි සංවිධානය පිම්බු රාජ්‍ය නොවන සංවිධානවල හා බටහිරයන්ගේ කාර්යභාරය තවදුරටත් හෙළිදරවුකිරීම ය.

කොටි සංවිධානය එතරම් දක්ෂ සංවිධානයක් නොවන බව දැන් කාහට වුවත් පෙනී යන කරුණකි. එහෙත් බොහෝ අයට එදා එසේ නො පෙනිණි. පුම්බනු ලැබූ කොටින් දක්ෂයන් යැයි බොහෝ අයට බටහිරයන් විසින් එත්තු ගන්වනු ලැබ තිබුණි. බටහිරයන්ගේ, එනම් එහි ජනමාධ්‍යවල හා උගතුන්ගේ, ප්‍රචාරවලට බටහිර සාමාන්‍ය ජනයා ද රැවටුණහ. කොටින්ගේ අනභිභවනීයත්වය පිළිබඳ ව ලොවට ම ඇසෙන්නට කරුණු කීවෝ බටහිරයෝ ය. කොටින්ගේ ත්‍රස්තවාදී ව්‍යාපාරය සාධාරණ එකක් බවට ද ඔවුහු ලෝ පුරා ප්‍රචාරය කළහ.

කොටි අවි ආයුධ මිලදී ගත්තේ දෙමළ ජනයා එතෙර සිට එවන ලද මුදලින් යැයි අපට එත්තු ගැන්වීමට උත්සාහ කෙරිණි. එහෙත් උගත් යැයි කියන එතෙට වසන දෙමළ ජනයාගේ පෞද්ගලික තොරතුරුවලට අනුව නම් එසේ විය නො හැකි ය. ඔවුහු පොදු වැඩකට එතරම් යහපත් ප්‍රතිචාරයක් නො දැක්වූහ. කොටි සංවිධානයට ආයුධ හා වෙනත් උපකරණ බොහොමයක් ලබා දී ඇත්තේ බටහිරයන් විසින් බව පැහැදිලි වෙයි.

මේ සඳහා ඉතා හොඳ ජාලයක් ඔවුන් සතුව තිබුණි. ඒ ජාලයෙහි බටහිර රාජ්‍ය නොවන සංවිධාන හා බටහිරයෝ ක්‍රියාකාරීහු වූහ. ලංකාණ්ඩුව රවටා ආහාර හා වෙනත් ද්‍රව්‍ය උතුරට,හා වෙනත් ප්‍රදේශවලට ද කිලිනොච්චියට ද යවා ඉන් ප්‍රධාන හෝ වැදගත් හෝ කොටස කොටි සංවිධානය වෙත ලබා දීමට බටහිරයන් කටයුතු කර ඇත්තේ දශක දෙකකට වැඩි කාලයක සිට ය. ඊනියා සංවර්ධනයක් සඳහා රාජ්‍ය නොවන සංවිධාන විසින් යවන ලද භාණ්ඩවලින් උතුරු පළාතේ සිදු වී ඇති සංවර්ධනය කුමක් ද? අද හමුදාවන්ට හා ජනමාධ්‍යයන්ට දැකගත හැකි කරුණ නම් රාජ්‍ය නොවන සංවිධාන හා බටහිරයන් විසින් සංවර්ධනය කරනු ලැබී යැයි කියන පෙදෙස්වල කිසිම සංවර්ධනයක් පසුගිය දශක දෙකක පමණ කාලයක සිදු වී නොමැති බව ය.

© Prof. Nalin De Silva

එසේ නම් රාජ්‍ය නොවන සංවිධාන හා බටහිරයන් විසින් සංවර්ධනයට යැයි කියමින් ගෙන යනු ලැබූ භාණ්ඩ කොටි සංවර්ධනය සඳහා යොදවා ඇති බව පැහැදිලි ය. ජනතාවගේ නාමයෙන් මේ සංවිධාන කර ඇත්තේ කොටි සංවිධානයට ආධාර කිරීම බව පැහැදිලි ය. ඇතැම් බටහිර රටවල් තම තානාපති වරප්‍රසාද ද යොදා ගනිමින් ආණ්ඩුව රවටා උතුරට  යැවූ භාණ්ඩ අතර ආයුධ නොතිබිණි යැයි කිව හැකි ද? ආණ්ඩුව අදවත් මේ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්විය යුතු ය.

බටහිරයන්, රාජ්‍ය නොවන සංවිධාන හා ජඩමාධ්‍ය ක්‍රියාකර ඇති ආකාරය පැහැදිලි ය. අප සැමදාමත් කියා ඇත්තේ කොටි සංවිධානය යනු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ බළල් අතක් බව ය. කොටි පමණක් නොව ප්‍රභාකරන්ගේ සීයලා හා බාප්පලා වූ පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුණාෂලම්, ජී ජී පොන්නම්බලම් ආදීන් ද පුම්බනු ලැබුයේ බටහිරයන්, විශේෂයෙන් ම බ්‍රිතාන්‍යයන් විසිනි. බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය වූයේ දෙමළ නායකයන් යොදා ගනිමින් සිංහල බෞද්ධයනට පහර ගැසීමට ය. දෙමළ ජාතිවාදීන් වූ මේ දෙමළ නායකයන් ලවා මුල දී සිංහලත්වයට එරෙහිව ක්‍රියාකළ බ්‍රිතාන්‍යයෝ පසුව අනෙක් බටහිරයන් ද සමගින් ප්‍රභාකරන් පෝෂණය කළහ.

ප්‍රභාකරන් හා ඔහුගේ ත්‍රස්තවාදී මිනීමරුවෝ යුද්ධ දක්ෂයෝ නො වූහ. ඔවුන් දැන සිටියේ බෝම්බ ගැසීමට, බෝම්බ වැළලීමට හා මිනී මැරීමට පමණකි. එහෙත් බටහිරයෝ හා ඊනියා යුද විශේෂඥයෝ කොටි අනභිබවනීය හමුදාවක් ලෙස හැඳින්වූහ. ඒ ඔස්සේ මෙරට ව්‍යාජ මානව අයිතිවාසිකම් සංවිධාන හා සාම මණ්ඩල පිහිටුවා එමගින් සිංහලයන් බියගන්වමින් ආණ්ඩුවට නොයෙකුත් බලපෑම් කරමින් හමුදා මෙහෙයුම් ඉදිරියට යෑම වැළැකූහ. අනෙක් අතට රනිල් වික්‍රමසිංහ හා චන්ද්‍රිකා කුමාරතුංග වැන්නෝ මෙරට නායකයෝ නො වූහ. ඔවුහු බ්‍රිතාන්‍යයන් විසින් අප වෙනුවෙන් ඇතිකරන ලද ව්‍යාජ නායකයෝ වූහ. ඔවුන් බලයේ සිටිය දී ද අප ඒ කතාව කී බව මතක් කළ යුතු ය. ඒ ව්‍යාජ නායකයෝ බ්‍රිතාන්‍යයන් කී ඕනෑම කරුණක් ඉටුකිරීමට බැඳී සිටියහ. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය 1996 දී කොටින්ට පුනරීන් පාවා දුන්නී ය. රනිල් වික්‍රමසිංහ මහතා ඊනියා සටන් විරාම ඔස්සේ කොටින්ට උතුරු හා නැගෙනහිර පළාත් පාවා දුන්නේ ය. ඔවුන් යටතේ කෙරුණු හරි හමන් හමුදා මෙහෙයුමක් නො වී ය.

මහින්ද රාජපක්ෂ මහතා මෙරට මෙන් ම පිටරට ද විජාතික බලවේගවලට යට නොවී හමුදා මෙහෙයුම් ඉදිරියට ගෙනගියේ ය. ඒ මහතාගේ දේශපාලන නායකත්වයට ගැලපුණු හමුදා නායකත්වයක් ද විය. අනභිබවනීය යැයි කී කොටි කැණහිළුන් මෙන් දිවූහ. අප එසේ කියන්නේ හමුදාවන්හි ජයග්‍රහණය අවතක්සේරු කිරීමට නො වේ. හමුදාවන්ගේ කැපවීම හා ධෛර්යය අපි ඉතා ඉහළින් අගය කරමු. කොටින්ට විරුද්ධ හමුදා මෙහෙයුම් බටහිරයන්ට හා ඉන්දියාවට යට නොවී නිසි පරිදි කෙළේ නම් දශක දෙකකට පෙර ම කොටි පරාජය කිරීමට තිබුණි.

කිලිනොච්චියට ඇතුල්වීමෙන් පසුව ආණ්ඩුව මේ සියල්ල පිළිබඳ ව ගැඹුරින් සිතා බැලිය යුතු ය. බටහිරයන් හා ඔවුන් විසින් පිහිටුවන ලද රාජ්‍ය නොවන සංවිධාන කොටි පිම්බීම, කොටින්ට මුදල්, වාහන හා ආයුධ ද ඇතුළු ආධාර සැපයීම ආදිය ගැන පරීක්ෂණ පැවැත්විය යුතු ය. ඒ අතර අර ගුවන් යානා ගුවන්ගත කළ ස්ථාන හා ඒ සඳහා ආධාර දුන් අය, ඒ පැදවූවන්, පල්ලිවල හා වෙනත් තැන්වල කොටි සඟවා ගෙන සිටි අය, කොටින්ට ඊනියා මානව ආධාර සැපයූ අය, ඊනියා සංවර්ධනයක් ගැන කියමින් උතුරට එනම් කොටින්ට භාණ්ඩ සැපයූ අය හා තවත් එවැනි පිරිස් ගැන සොයා බලා නීත්‍යානුකූල ව කටයුතු කළ යුතු ය.

දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ අනවශ්‍ය ලෙස මෙහෙයුම් දික්ගැස්සූ සියල්ලන් ගැන විමසිය යුතු ය. ඒ කාලය තුළ නිරපරාදේ මියගිය සියල්ලන් පිළිබඳ ව මේ සියල්ලෝ වගකිව යුත්තෝ වෙති. ඔවුන්ට ඒ පාප කර්මයෙන් අත්මිදිය නො හැකි ය. ඔවුන්ගෙන් පළිගැනීමක් ගැන මෙහි දී නො කියැවෙයි. එහෙත් ඔවුන් කර ඇති වැරදි නිකම් ම අමතක කළ හැකි නො වේ. ඒ අතර ආණ්ඩුව කළ යුතු වැදගත් කාර්යයක් වෙයි. ඒ මියගිය මෙන් ම ජීවත්වන හමුදා භටයන්ට නිසි ගෞරවය හා පිළිගැනීම ලබා දීම ය. එහි දී මූල්‍ය ආධාර ද අවශ්‍ය පරිදි ලබාදිය යුතු වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva